# 0පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No – 10120

ෆැක්ස් / தொலைநகல / Fax – 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone – 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site – www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail – dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO – 528/2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No – / 2024

දිනය / திகதி / Date – 26/03/2024 පැය 1125

## මාධ්‍ය නිවේදනය

### පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් සිදු කරන ලද වැටලීම් සම්බන්ධ තොරතුරු

**01.** **2024.03.25 වන දින පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරින් විසින් සිදු කරන ලද නීති විරෝධී මත්පැන් වැටලීම් සම්බන්ධ වාර්තාව පහත පරිදි වේ.**

02.

| වැටලීම් ගණන | අත්අඩංගුවට ගත් සැකකරුවන් ගණන | නීති විරෝධී මත්පැන් ප්‍රමාණය (ලීටර්) | ගෝඩා ප්‍රමාණය (ලීටර්) | වෙනත් දේපල |
|---|---|---|---|---|
| 01 | 01 | 33 | 370 | තඹ දඟර 01<br>යකඩ බැරල් 01 |

වැටලීම් සිදු කර අත්අඩංගුවට ගන්නා ලද සැකකරුවන් හා දේපල අදාළ පොලිස් ස්ථාන වෙත ඉදිරිපත් කර ඇත.

**02.** **අයිස් මත්ද්‍රව්‍ය හා හැෂ් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා කුරුණෑගල කඳවුර.**

2024.03.26 වන දින අළුයම් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා කුරුණෑගල කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත කුරුණෑගල පොලිස් වසමේ වඳුරාගල ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 02 මිලි ග්‍රෑම් 420 ක්, හැෂ් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 03 මිලි ග්‍රෑම් 270 ක් හා එම ජාවාරමෙන් උපයා ගත් බවට සැකකරන මුදල් රුපියල් 46,500/- ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන කුරුණෑගල පොලිස් ස්ථානයට භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 30 ක් වූ වඳුරාගල ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.** කුරුණෑගල පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**03\. ගංජා මිශ්‍ර මදන මෝදක ගුලි හා විදේශීය දුම්වැටි සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා බුත්තල කඳවුර.**

2024.03.25 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා බුත්තල කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැල්ලවාය පොලිස් වසමේ වැල්ලවාය ප්‍රදේශයේ වැටලීමක් සිදු කර ගංජා මිශ්‍ර මදන මෝදක ගුලි 25 බැගින් අඩංගු පැකට් 97 ක් හා තීරු බදු රහිතව මෙරටට ගෙන්වන ලද විදේශීය දුම්වැටි 500 ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන වැල්ලවාය පොලිස් ස්ථානය වෙත භාරදී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 41 ක් වූ වැල්ලවාය ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

වැල්ලවාය පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**04\. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා පුෂ්පරාම උප කඳවුර.**

2024.03.25 වන දින දහවල් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා පුෂ්පාරාම උප කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත මිදිගම පොලිස් වසමේ වැලිගම ප්‍රදේශයේ වැටලීමක් සිදු කර අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 04 ක් මිලි ග්‍රෑම් 700 ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට මිදිගම පොලිස් ස්ථානය වෙත භාරදී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 41 ක් වූ වැලිගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

මිදිගම පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**05\. හෙරොයින් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා අක්කරපත්තුව කඳවුර.**

2024.03.25 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා අක්කරපත්තුව කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත සයින්දමරුදු පොලිස් වසමේ සයින්දමරුදු 06 ප්‍රදේශයේ වැටලීමක් සිදු කර හෙරොයින් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 04 ක් මිලි ග්‍රෑම් 700 ක් හා එම ජාවාරමෙන් උපයා ගත් බවට සැකකරන මුදල් 8,500/- ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන සයින්දමරුදු පොලිස් ස්ථානය වෙත භාරදී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 58 ක් වූ සයින්දමරුදු ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

සයින්දමරුදු පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**